

(C) Sumitha Publishers

අන්ධ මිනිසෙක්
දවසක් දා යාළුවෙක් බලන්ඩ ගියා.
යාළුවෝ දෙන්නා රෑ වෙනකල්
කතා කර කර හිටියා.

කළුවර වැටුණාට පස්සේ
අන්ධ මිනිසා යන්ඩ ලෑස්ති වුණා.
"යාළුවේ ආපහු යන්ඩ මම ඔයාට
ලන්තෑරුමක් දෙන්නම්"
මිතුරා කිව්වා.

"ලන්තෑරුමක්...? ඇයි මට ලන්තෑරුමක්..?
මට පේන්නේ නෑනේ" අන්ධ මිනිසා කිව්වා.

"ඔයාට පේන්නේ නෑ තමයි.
ඒ වුණාට ඔයා ඒක අරන් යනකොට
අනික් අයට ඔයාව පේනවා"
යාළුවා කිව්වා.

යාළුවා එයාට ලන්තෑරුම දුන්නා.



(C) Sumitha Publishers